**උඩුබද්දාව ප්‍රාදේශීය සභාව - 2022**
**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි සඳහා දරන ලද වටිනාකම රු.1,877,452 ක් වූ ඉදිකිරීම් ප්‍රාග්ධනීත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට අඩුපාඩු නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගන්නා ලද වටිනාකම රු.440,550 ක් වූ කාර්යාල උපකරණ, රු.134,775 ක වටිනා යන්ත්‍ර හා උපකරණ සහ වටිනාකම රු.324,350 ක් වූ ලී බඩු 2022 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | රු.195,000 ක් වූ ඉඩම් 04 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. | මේ වන විට ඉඩම් හා ගොඩනැගිලි ස්ථාවර වත්කම් ලේඛන සකස් කරමින් පවතින බව. | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 05 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.4,589,509ක වෙනසක් විය. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් සකස් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වසර 02 ට වැඩි කාලයක් පැවති රු.719,299 ක් වූ තැන්පත් නියාදනය කර නොතිබුණි. | අත රැඳවුම් රු.163,337ක මුදල් ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.19,816,376 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,040,903 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් රැස්කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තු ගතආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| I. | වරිපනම් හා බදු | 3,624 | 2,296 | 2,072 | 224 | 3,446 | 4,083 | 2,258 | 1,825 |
| II. | කුලී | 1,356 | 12,137 | 11,313 | 824 | 12,301 | 7,395 | 6,710 | 684 |
| III. | බලපත්‍ර ගාස්තු | 13,563 | 873 | 873 | - | 1,041 | 891 | 891 | - |
| IV. | වෙනත් ආදායම් | 2,181 | 58,858 | 48,601 | 10,257 | 62,444 | 39,176 | 4,618 | 34,557 |
| | එකතුව | 20,724 | 74,164 | 62,859 | 11,305 | 79,232 | 51,545 | 14,447 | 37,066 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | 2022 දෙසැම්බර් 31 දිනට රු.4,198,764 ක් වූ මුළු හිඟ වරිපනම් බදු ශේෂය තුළ වූ වසර 05 ට වැඩි හිඟ වටිනාකම රු.1,567,357 ක් හා වර්ෂ 02 ත් 05 ක් අතර හිඟ හිටි වටිනාකම රු.2,059,995 ක් අයවිය යුතුව පැවතුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | වරිපනම් බදු නිසි ලෙස අය කළ යුතුය. |
| (ආ) | **අක්කර බදු** | | |
| | 2022 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි අක්කර බදු ශේෂය රු.93,179 ක් අයවිය යුතුව පැවතුණි. | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අක්කර බදු ගෙවන බොහෝ ඉඩම් මේ වන විට වෙනත් අයට විකුණා දමා ඇති අතර, තවත් කොටසක දේපල කොටස් වී ඇති බව. | අක්කර බදු නිසි ලෙස අය කළ යුතුය. |
| (ඇ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 අප්‍රේල් 12 දින වනවිට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.43,883,364 ක් හා උසාවි දඩ රු.249,922ක් අයවිය යුතුව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ සිට අය නොවී පවතින වැටුප් ප්‍රතිපූර්ණ වටිනාකම රු.14,781,431 ක් අයකරගැනීම හෝ වෙනත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමකින් තොරව ණයගැති ලෙස ගිණුම්ගත කර තිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් එම මුදල ප්‍රතිපූර්ණය කිරිමට නොහැකි බව දක්වා ඇති බැවින් පොදු අරමුදලින් පියවීමට ඉදිරියේදි කටයුතු කරන බව. | අදාළ ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ගිණුම් ශේෂ 11 කට අදාළව ලැබිය යුතු ශේෂය රු.110,602,608 ක් වූ අතර වසර 5 කට වැඩි කාලයක සිට පැවත එන රු.6,602,342 ක ශේෂයක් පැවතුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂයන් කඩිනමින් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂ 05 කට අදාළව රු.39,400,708 ක ගෙවිය යුතු ශේෂයක් පැවති අතර ඒ තුල වර්ෂ 05 කට වඩා පැරණි රු.19,369 ක ටෙන්ඩර් තැන්පත් ශේෂයක්ද, වසර 01 - 05 දක්වා කාලයට අදාළ රු.14,406,189 ක ශේෂයක් විය. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට ණයහිමි වටිනාකම නිරවුල් කිරීමටත්,ණයහිමි වටිනාකම් වැඩියෙන් වෙන්කිරීම් පවතිනම් ජ'නල් සටහන් මඟින්නිවැරදි කිරීමටත්, කටයුතු කරන බව. | ණයහිමි වටිනාකම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාව සතු ලී බඩු උපකරණ අයිතම 25 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී වටිනාකම තක්සේරු කර ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | වත්කම් වල වටිනාකම තක්සේරු කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 දිනැති සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව 2022 මාර්තු 04 දින වෙන්දේසි කරන ලද ලී බඩු උපකරණ, යන්ත්‍ර උපකරණ හා කාර්යාලීය උපකරණ වල සඳහා වටිනාකම් හඳුනාගෙන ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | අදාළ වටිනාකම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරිපනම් ගාස්තු අයකරනු ලබන දේපල සඳහා වසර 05 කට වරක් අගය තක්සේරු කර ඒ මත පදනම්ව ගාස්තු අයකල යුතු වුවද සභාව විසින් එසේ කටයුතු කර නොතිබුණි. | නව තක්සේරු සිදු කිරීම සඳහා සමීක්ෂණ කටයුතු GIS තාක්ෂණය මඟින් සිදු කරමින් සිටින බව. | දේපල නිසි පරිදි තක්සේරු කර විධිමත්ව ගාස්තු අය කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.9,400,374 ක් වූ යන්ත්‍ර හා උපකරණ සහ රු.13,384,465 ක් වූ ලී බඩු හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි. | නිවැරදි තොරතුරු සමඟ ගලපා අළුතින් ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගත යුතුය. |
| (ආ) | සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 51 ක් පැවති අතර ඉන් සුසානභූමි 47 ක් සහ ක්‍රීඩාපිටි 06 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 03 ක අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | සභාව විසින් නඩත්තු කරන භූමි 47 ක් හා ක්‍රීඩා පිටි 06 ක් සභාව වෙත පවරා ගැනීමට අදාලව ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | මෙම වත්කම් කඩිනමින් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව සතුව පැවති ඇම්බියුලන්ස් රථය අළුත්වැඩියා කටයුතු සිදු කිරීමකින් තොරව ගාල්කර තිබුණි. | එම රථය අළුත් වැඩියා කිරිම සඳහා සභාවේ ප්‍රතිපාදන නොතිබු බැවින්, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2022 වර්ෂයේ ප්‍රතිපාදන ඉල්ලා සිටියත්,එම වර්ෂයේ ප්‍රතිපාදන ලබාදිමට නොහැකි බව. | වත්කම් ප්‍රශස්තව උපයෝජනය කළ යුතුය. |

### 3.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 දෙසැම්බර් 31 දින වන විට රු.1,200,000 කට ඇස්තමේන්තු කළ ව්‍යාපෘතියක් වැඩ ආරම්භ කිරීම සිදුකර නොතිබූ අතර, රු.5,434,258 කට ඇස්තමේන්තු කළ ව්‍යාපෘති 10 ක වැඩ නිමකර නොතිබුණි. | 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ නිම කිරිමට කටයුතු කරන බව. | ඇස්තමේන්තු කල කර්මාන්ත අපේක්ෂිත පරිදි නිම කළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සේවකයින් දෙදෙනෙකුට අදාලව රු.217,020 ක අය නොවන සේවක ණය ශේෂයක් පැවතුණි. | මෙම නිලධාරින්ට සේවක ණය හිඟ මුදල ගෙවන ලෙස ලිපි මඟින් දැනුවත් කර ඇති බව. | සේවක ණය නිසි පරිදි අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුනරාවර්තන වියදම් විෂයයන් 100 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 60 වඩා අඩු ප්‍රතිපාදන ප්‍රමාණයක් පමණක් වර්ෂය තුල උපයෝජනය කර තිබූ අතර ප්‍රාග්ධන වැය විෂයයන් 10 කට අදාලව ප්‍රතිපාදන මුදලින් සියයට 60 කට අඩු ප්‍රමාණයක් පමණක් වැය දරා තිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 1222/3 මඟින් රජයේ වියදම් පාලනය කිරිම හා ඇස්තමේන්තු ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහාම වැය කිරිමට නොහැකි බව හා ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම,වියදම් පාලනය කිරිම හා අත්‍යාවශ්‍ය කාර්ය සඳහා වැය දැරිමට සිදු වීම මීට හේතු වූ බව. | තාත්විකව අයවැය පිළියෙල කිරීමට හා එය මත පදනම්ව ප්‍රතිපාදන ප්‍රශස්තව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |